
# 08
# අභියෝග මැද මෙහෙවර



පළමු මිෂනාරි ගමනේ ලද අත්දැකීම් තුළින් ඉදිරියට පැමිණෙන අභියෝගවලට මුහුණ දීමට දුන් පිළිතුරක් ලෙස දෙවන ධර්ම දූත ගමන හැඳින්විය හැකි ය. දෙවන ධර්ම දූත ගමන වසර තුනක කාලයක් පමණ සිදු වූ බව පැවසේ. එය ක්‍රි. ව. 49 : 52 දක්වා යැයි සැක කරනු ලබයි. **නායකත්ව ගැටුම්, ලුස්ත්‍රාවේ ඇති විය හැකි වූ සංස්කෘතික ගැටුමට පිළියම් යෙදීම, සිරගත වීම, බහුදේවවාදය තුළ දේශනා කිරීම යන විවිධ අභියෝගතාවලට මුහුණ දෙමින් සාර්ථක** ලෙස තම මෙහෙවර ඉටු කරමින් කිලෝ මීටර් 4320 ප්‍රමාණයක ගමනක මෙසේ යෙදී ඇති බව අපට පෙනේ.


## ❖ පාවුලු හා බාර්ණබස් අතර ඇඩි විවාදය (ක්‍රියා 15 : 36 - 41 )

යොහන් මාර්ක් බාර්ණබස්ගේ ඥාති සහෝදරයකු යැයි සඳහන් වේ. (කොලොස්සි 4 :10) යොහන් මාර්ක් රැගෙන යායුතු යැයි බාර්ණබස් පැවසූ නමුත් තමන් සමඟ සේවයට නොගොස් පම්පිලියේ පර්ගාවල දී ඉවත් ව ගිය තැනැත්තකු තම සේවයට නුසුදුසු බව පාවුල්තුමා සිතුවා විය හැකි ය. (ක්‍රියා 15:38) මේ මත ගැටුම පිළිබඳ අභියෝගයට මුහුණු දී එයට සමාකාමී විසඳුමක් ලබා ගත් පසු බාර්ණබස් යොහන් මාර්ක් ද පාවුල් සීලස් ද කැටුව මෙහෙවරට පිටත් ව ගියහ. එසේ ම රෝමයේ සිර ගෙදර දී පාවුලු සමඟ යොහන් මාර්ක් සිටි බවට ඉදිරියේ දී ඔබට දැක ගත හැකි ය.

**ලුස්ත්‍රාව** ජුදෙව් (මව) ග්‍රීක (පියා) යන පවුලෙහි තිමොතියස් යන දරුවා යුදෙව්වරුන් අතර සේවයක් කිරීමට සිදු වන නිසා චර්මඡේදනය කළේ ය.

**ත්‍රෝවසය** මසිදෝනියට ඇවිත් අපට ආධාර කරන්න යැ යි සිහිනයක් දුටුවේ ය.

## දෙ වන ධර්ම දූත ගමන



❖ පාවුල්ගේ දෙ වන ධර්ම දූත ගමන ( ක්‍රියා 15 : 18 - 22 )

අන්තියෝකිය (සිරියාව)
(ක්‍රියා 15 : 36  40 )

→ සිරියාව හා සිලිසියා
(ක්‍රියා 15 : 41 )

→ දර්බය, ලුස්ත්‍රාව, ඉකෝනිය, පිසිදියේ අන්තියෝකිය
(ක්‍රියා 16 : 02  03)

→ පිරිගිය හා ගලාතිය
(ක්‍රියා 16 : 06 )

→ මිසිය (ක්‍රියා 16 : 07  08)

→ ත්‍රෝවසය
(ක්‍රියා 16 : 08  10)

→ සමොත්‍රාසි (ක්‍රියා 16 : 11)

→ නෙයොපොලිසය
(ක්‍රියා 16 : 12)

→ පිලිප්පි (ක්‍රියා 16 : 12)

→ තෙසලෝනියාව
(ක්‍රියා 17 : 10)

→ බෙරිය
(ක්‍රියා 17 : 10)

→ අතීනසය
(ක්‍රියා 17 : 15)

→ කොරින්ති
(ක්‍රියා 08 : 01)

→ එපිසය (ක්‍රියා 18 : 19)

→ කායිසාරිය (ක්‍රියා 18 : 22)

## පිලිප්පිය :-

පාවුල් යුරෝපයේ තමාගේ කටයුතු ආරම්භ කළේ මෙහි දී ය. වට පිටාවේ රන් ආකර නිසා ප්‍රසිද්ධියක් ලබා ඇත. දෙ වන මිෂනාරී ගමනේ මෙහි නවතා ගිය ලූක්තුමා නැවත පාවුල්ට එක් වනුයේ තුන් වන මිෂනාරී ගමන අවසානයේ දී ය.

## පිලිප්පියේ දී මුහුණ පෑමට සිදු වූ අභියෝග (ක්‍රියා 16 : 11 - 40 )

- දම්පාට සායම් බඩු වෙළෙඳාම් කරන ලිදියාගේ හැරීම හා බව්තීස්මය.
- ගුප්ත ආත්මයක් අවේශ වූ තරුණියක් සුව කිරීම නිසා ඇයගෙන් ලාභ ලැබූ ස්වාමිවරු කිපී වෙළඳපොළට ඇදගෙන ගොස් ප්‍රධානීන් ඉදිරියේ සිටුවීම.
- බොරු චෝදනා නැගීම, ජනයා විරුද්ධ වීම, නඩුකාරයන් ද ඔවුන්ගේ වස්ත්‍ර ඉරීම කෝටු වලින් තැලීම හිර ගෙදර දඬු කඳේ ගැසීම.
- පීඩනය මධ්‍යයේ ප්‍රශංසා කිරීම  ප්‍රශංසා ගීත ගැයීම  අනෙක් හිරකාරයන් ඔවුන්ට සවන් දීම  පොළොව කම්පා වී දොරවල් විවෘත වී බැඳුම් ලිහී පැන යාමට හැකියාව ලැබීම  හැකියාව තිබිය දීත් පැන නොයාම.
- පලා ගියා යැ යි  සිතා හිරගෙදර මුලාදෑනියා දිවිනසා ගැනීමට තැත් කිරීම අනතුරක් කර නොගන්න අපි මෙහි ය පැවසීම  ගැලවීමට මා කුමක් කළ යුතු දැ යි මුලාදෑනියා ඇසීම.
- ක්‍රිස්තුස් වහන්සේ අදහා ගන්න, ඔබ ගැලවෙන්නෙහි ය. ජීවිත සාක්ෂියට අමතර ව කෙටි දේශනය. ගෙදර වැසි සියල්ලන් අදහා බව්තීස්මය ලැබීම.
- තුවාල සෝදා සැලකීම සත්කාර කිරීම.
- නිදහස් කර හරින්න පණිවිඩය ලැබූ විට රෝම පුරවැසිභාවය භාවිත කිරීම එනම් අසාධාරණ චෝදනා කර විනිශ්චයකින් තොර ව තමන් හිර කිරීම වරද සම්බන්ධ ව නඩු කාරයාට පවා අභියෝග කිරීම.
- කන්නලව් කොට යැවීම.

මෙහි දී පාවුල් හා සීලස් දුක් විඳීමේ අභියෝගය මැද ක්‍රියා කළ ආකාරය ප්‍රසංසනීය යි.

**එදා පිලිප්පියේ දී වූ සිදු වීම් වැනි සිදුවීම් වැළැක්වීම සඳහා වර්තමානයේ මානව අයිතිවාසිකම් ප්‍රඥාප්තියේ ආවරණය ලැබේ. එහි මෙසේ සඳහන් ය.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් යන ශීර්ෂය යටතේ

| | |
|---|---|
| 10 වගන්තිය | "සෑම තැනැත්තකුට ම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළු ව සිතීමේ නිදසට හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය. |
| 11 වගන්තිය | කිසිම තැනැත්තකු වද හිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය. |
| 13(I) වගන්තිය | නීතියෙන් නියම කරුණු ලැබූ කාර්ය පටිපාටියට අනුකූල ව මිස කිසි ම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේ ය. |

## ඇතන්ස් - (අතීනසය) (ක්‍රියා 17 : 16 - 33 )

ඇතන්ස් ග්‍රීසියේ ප්‍රමුඛ නගරයකි. අලුත් ගිවිසුම් කාලය වන විටත් මෙය ලෝකයේ සංස්කෘතික හා ඉගෙනීමේ මධ්‍යස්ථාන විය. පාවුල් තුමා මෙහි මාර්ක් කන්ද මත ඇරියොපගේ ශාලාවේ සිට ඇතන්වැසියන් ඇමතී ය. වෙළෙඳපොළේ හමු වූවන් සමඟ වාද කළේ ය. ඇතන්ස් වැසියන් අළුත් මතිමතාන්තර ගැන පමණක් කථා කරමින් කාලය ගෙවූහ. මේ නුවර දේව රූපවලින් පිරී තිබුණි.

## ඇතන්ස් (බහුවිධ සමාජයක) අභියෝග

- පාවුල් තුමා නුවර දේව රූපවලින් පිරී තිබෙනු දක්නා ලදි. එම දේව රූප නිරීක්ෂණය කොට එය භාවිතයට ගෙන ඒ තුළින් තම පණිවිඩ ප්‍රකාශ කරයි. ඒ තුළින් තමා හඳුනන අවට පරිසරය තුළින් ඔවුන් තුළට පිවිසීමේ ස්ථානෝචිත ප්‍රඥාව පෙන්වා දෙයි.

- ඔවුන් දැන සිටි සංස්කෘතිය, සාහිත්‍යය දේව පණිවිඩය සඳහා යොදා ගැනිණි.

- ස්තෝයික හා එපිකූරිය පණ්ඩිතයන්ගේ වැනි බහු මත වාද අභියෝගයක් වූ විට එය දේව පණිවිඩ ප්‍රකාශයට අදාළ ලෙසින් යොදා ගත්තේ ය.

- විවධ රූප නමස්කාරය කළ විවිධ දෙවිවරු ඇදහූ අයගේ බහු ආගමික පරිසරය තුළ අන්‍ය ආගමිකයන්ට නින්දා නොකරන ලදී. " ඔබ සැම ආගමට ලැදි බව අපි දනිමු." ය පවසමින් ඔහුගේ ආගමට ලැදි බව අගයමින් දහම ලබා දීමට තැත් කළේ ය.

- පූජාසන අතුරින් නොදන්නා දෙවියන්ට පූජාසනය යන්න මතු කරමින් තමාට හුරු පුරුදු පරිසරය තුළින් නොදන්නා දෙවියන් වහන්සේ හඳුන්වා දුන්නේ ය.

- සියලු දේ මැව්වේ එතුමාණන් ය. ( එහෙයින් මැවිල්ල දෙවියන් වහන්සේට පහළින් ඇති දෙයක් නිසා ) අතින් සෑදූ මාළිගාවල එතුමාණන් වැඩ වාසය නොකරයි. ඒ නිසා රූප වන්දනාව අනවශ්‍ය බව (ක්‍රියා 17 : 24 ) හා ජීවමාන දෙවියන් අදහා ගැනීමෙ අවශ්‍යතා ව පෙන්වීය.

- මළවුන්ගේ උත්ථානය ගැන පැවසූ විට ඒ ගැන ප්‍රතිචාර දෙකක් සහිත අභියෝගයක් ලැබිණි. පිළිගැනීම තුළින් බව්තිස්මය හා සරදම් කිරීම යි.



**ඇතන්ස්හි දී දක්නට ලැබෙන පණ්ඩිතයින් වර්ග දෙක**

| ස්තෝයික | එපිකූර්ය |
|---|---|
| × සොම්නස හෝ වේදනාව, සඵලත්වය හෝ පරාජය හේතුවෙන් යමකුට යම් බලපෑමක් ඇති වීමට ඉඩ නොතිබීම. | × ජීවිතයේ පරම යහපත ප්‍රීතිය සපුරා ගැනීම යැ යි ඉගැන්වීම |
| × ප්‍රීතිය ඇති වීමේ මාර්ගය ඉගැන්වීම. | × ලොව සිදු වන දේවලට දෙවිවරුන්ගේ සම්බන්ධතාවක් නැත. |
| × තර්කානුකූල තීරණ සදාචාරාත්මක හැසිරීම හා ආත්ම දමනය වැදගත්කම අවධාරණය. | |
| × දෙවිවරු ඇත. | × දෙවිවරු නැත. |

**<u>අරියෝපගේ ශාලාව</u>**

ඇතන්ස් නගර සභාව රැස්වූයේ මෙහි ය. ප්‍රසිද්ධ කථාවට යොදාගත් ස්ථානයකි. කථාවට සවන් දී විනිශ්චය හා විවේචන අයිතිය රැස් වුවන් සතු විණි.

**කොරින්තිය :- (ක්‍රියා 18 : 1 - 17 )**

වැදගත් ග්‍රීක නුවරකි. වස්තුවට හා දුරාචාරයට ප්‍රසිද්ධිය දරයි. රෝමයේ වෙළෙඳ නගරයකි. දුප්පතුන් හා කම්කරුවන් බහුල ව විසී ය.

- පාවුල් අකිලා හා ප්‍රිසකිලාට එකතු ව කූඩාරම් සෑදීම.
- දීර්ඝතම කාලය වන වසර 1 1/2 එහි රැඳී සිටීම.
- තීතස් ජුස්තස්ගේ ගෙදර යෑම. ධර්ම ශාලා මුළාදෑනි ක්‍රිස්පස් සහ නිවැසියන් අදහා ගැනීම.
- ඔහු අධෛර්යයට පත් වීමේ අභියෝගය තුළ දෙවියන් වහන්සේ රාත්‍රියේ දර්ශනයකින් පාවුල් ධෛර්යමත් කිරීම.
- ක්‍රිස්තු වර්ෂ 50 දී ගලියෝ අකයියාවේ අධිපතියා වූ විට පාවුල් ඔහු වෙතට ගෙන යෑම හා එම අභියෝගයට මුහුණ දීම.
- ජුදෙව් ව්‍යවස්ථාවට විරුද්ධ ඔබේ ප්‍රශ්න ඔබ ම බලාගන්න කියා නිදහස් කිරීම.

පාවුල්තුමා දෙවන ධර්ම දූත ගමන තුළ ක්‍රියා කළ ආකාරය සිහිපත් කිරීමේ දී අපට උගත හැකි ප්‍රධාන පාඩම වන්නේ ගැටළු අභියෝග මධ්‍යයේ ඉන් පළා නොගොස් එයට ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතු ව මුහුණ දිය යුතු බව යි. එසේම බහුවිධ පරිසරය තුළ අභියෝගවලට නිර්මාණශීලී ව මුහුණ දී සාක්ෂි දැරීමට මඟ පෙන්වීම මේ පාඩම තුළින් සිදු කෙරේ.

❖ **ඇගැයීම** :-

වර්තමාන බහු විධ ශ්‍රී ලාංකික සමාජය තුළ දහම ප්‍රකාශ කිරීමේ දී ඇතන්ස් වල ධර්ම ප්‍රකාශනයෙන් ගත හැකි පාඩම් මොනවා ද?